# GOVERNMENT INTERVENTIONS TO THE MARKET (Part-V)

*S. Madushanka*

*B.Sc (Mgt) Accounting (Special) (U.G)*

*University of of Sri Jayewardenepura*

# ආණ්ඩුව වෙළෙඳපොළ මිල පාලනය කිරීම

කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් හෝ සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් බලවේග මගින් තීරණය වී ඇති මිල ඇතැම් විට, පාරිභෝගිකයන්ට සහ නිෂ්පාදකයන්ට අසාධාරණ විය හැකි ය.

මෙවැනි අවස්ථාවන්හි දී ආණ්ඩුව වෙළෙඳපොළ මිල පාලනය කරයි.

ඒ අනුව මිල පාලනය යනු ආණ්ඩුව විසින් නීතිරීති අණපනත් උපයෝගී කරගෙන කෘත්‍රිම මිලක් වෙළෙඳපොළෙහි ඇති කිරීම යි.

මිල පාලනයක් තුළින් ආණ්ඩුව අපේක්ෂා කරන්නේ එක අතකින් පාරිභෝගිකයාත්, අනෙක් අතට නිෂ්පාදකයාත් ආරක්ෂා කිරීම යි.

## මිල පාලනයේ ස්වරූප

- උපරිම මිල නියම කිරීම
- අවම මිල නියම කිරීම

Classwork.LK

# උපරිම මිල නියම කිරීම

වෙළෙඳපොළ මිල යාන්ත්‍රණය යටතේ තීරණය වූ සමතුලිත මිල පාරිභෝගිකයාට අසාධාරණ වෙතැයි සිතූ විට ඔවුන්ට සාධාරණත්වය සැලසීම සඳහා ආණ්ඩුව විසින් නියම කරනු ලබන නීත්‍යානුකූල මිල උපරිම මිල සීමාව නමින් හැඳින්වේ.

**නිදසුන් :-**

සහල්, පාන් , සිනි , පරිප්පු මිල නියම කිරීම
කිරි පිටි මිල නියම කිරීම
උපරිම ගෙවල් කුලී නියම කිරීම


ආණ්ඩුව උපරිම මිල සීමා නියම කරනු ලබන්නේ පාරිභෝගිකයන්ට සාධාරණත්වය සඳහා වන බැවින් සමතුලිත මිලට වඩා පහළින් උපරිම මිල සීමා පැනවීම වැදගත් ය.

## සඵල උපරිම මිල

සමතුලිත මිලට වඩා පහළින් නියම කරනු ලබන උපරිම මිල සීමාව සඵල උපරිම මිල නමින් හැඳින්වේ.

ClassWork.LK

# සඵල උපරිම මිල සීමා නියම කිරීම රූප සටහනෙන් දැක්වීම




ඉහත රූප සටහනෙහි දක්වෙන පරිදි P1 උපරිම මිල සීමාව නිසා ඉල්ලුම් ප්‍රමාණය Q-Q1 දක්වා වැඩි වී ඇති අතර, සැපයුම් ප්‍රමාණය Q-Q2 දක්වා අඩු වී ඇත.

මෙහි ප්‍රතිඵලය වශයෙන් වෙළෙඳපොළෙහි Q2-Q1 දක්වා වන අධි ඉල්ලුමක් හටගෙන ඇත.

ClassWork.LK

එසේ ම Q2 ලෙසින් වන සැපයුම් ප්‍රමාණය P2 ලෙසින් වන කළුකඩ මිලකට අලෙවි කිරීමට ද නිෂ්පාදකයෝ පෙලඹෙති.

## උපරිම මිල සීමා නියම කිරීම නිසා ඇති වන ප්‍රතිවිපාක

- අධි ඉල්ලුම නිසා වෙළෙඳපොළෙහි භාණ්ඩ හිඟයක් ඇති වීම.

- නීති විරෝධි කළු කඩ මිල යටතේ භාණ්ඩ අලෙවි කිරීමට තැත් කිරීම.

- කළු කඩ මිල නිසා පෙර තිබූ සමතුලිත මිලටත් (p) වඩා ඉහළ මිලකට (p2) භාණ්ඩ අලෙවි කිරීම.


- උපරිම මිලත් සමඟින් නිෂ්පාදකයන් ගේ ලාභ සීමා වන නිසා එම නිෂ්පාදන ක්ෂේත්‍රයේ කරනු ලබන ආයෝජන සීමා වීම.

- උපරිම මිල සීමාව නිසා පාරිභෝගික අතිරික්තයට සහ නිෂ්පාදන අතිරික්තයට ද අයහපත් බලපෑමක් ඇති වී සමාජ ශුභ සාධනයට ද හානි වීම.

ClassWork.LK

# <u>උපරිම මිලක් තුලින් සමාජ ශුභ සාධනයට සිදු වන බලපෑම</u>

උපරිම මිලක් පාරිභෝගික අතිරික්තයට, නිෂ්පාදන අතිරික්තයට බලපාන ආකාරය සහ ඒ අනුව සමාජ ශුභ සාධනයට සිදු වන බලපෑම පහත ලෙස රූප සටහනකින් දක්විය හැකි ය.




උපරිම මිලට පෙර පාරිභෝගික අතිරික්තය = A+B+C

උපරිම මිලට පෙර නිෂ්පාදක අතිරික්තය = D+E+F

උපරිම මිලට පෙර ආර්ථික අතිරික්තය = A+ B+C+D+E+F

ClassWork.LK

උපරිම මිලට පසු පාරිභෝගික අතිරික්තය = A (B+C අහිමි වී ඇත)

උපරිම මිලට පසු නිෂ්පාදක අතිරික්තය = F (D+E අහිමි වී ඇත)

උපරිම මිලට පසු ආර්ථික අතිරික්තය = A+F

අහිමි වූ ආර්ථික අතිරික්තය / අහිමි සුබසාධනය = B+C+D+E

ClassWork.LK

## <u>උපරිම මිල සීමා පැනවීම පාරිභෝගිකයාට බලපාන ආකාරය</u>

ඉහත රූප සටහනෙහි B+D පාරිභෝගික අතිරික්තයට එකතු කරනවා ද, නැද්ද යන්න තීරණය වීම කෙරෙහි බලපාන කරුණු දෙකකි.

- හිඟ භාණ්ඩ ලබා ගැනීමට වැය වන කාලය හා මුදල් ප්‍රමාණය

- පෝලිමේ සිටීමට ගත වන කාලය

මෙම කරුණු දෙක සඳහා අමතර පිරිවැයක් දැරීමට පාරිභෝගිකයාට සිදු නොවේ නම් B+D කොටස්වල ක්ෂේත්‍රඵලය ද පාරිභෝගික අතිරික්තයට එකතු වේ.

ඉහත ගණනය කරන ලද තොරතුරු ද සමඟින් උපරිම මිල සීමා පැනවීම පාරිභෝගිකයාට බලපෑ ආකාරය පැති දෙකකින් විග්‍රහ කළ හැකි ය. එනම්

- B+D = පාරිභෝගික අතිරික්තයෙන් අහිමි වීම

- B+D = පාරිභෝගික අතිරික්තයෙහි සිදු විය හැකි වැඩි වීම

ClassWork.LK

පාරිභෝගිකයාට වූ බලපෑම +(B+D) නිෂ්පාදන අතිරික්තයෙහි සිදු වූ අහිමි වීම -(B+C+D+E) සමඟ ගැළැපීමෙන් අහිමි ශුභ සාධනය පහත පරිදි ලබාගත හැකි ය.

අහිමි ශුභ සාධනය = B+D - ( B+C+D+E)

= - (C+E)

ClassWork.LK

# උපරිම මිල අර්ථවත් කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග

උපරිම මිල අර්ථවත් වන්නේ එහි අපේක්ෂිත වාසිය එලෙසින් ම පාරිභෝගිකයාට ලැබේ නම් ය.

ඒ අනුව උපරිම මිල අර්ථවත් කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයකි.

- ආනයනය
- නිෂ්පාදකයන් දිරිගැන්වීම
- සලාක කිරීම

උපරිම මිල නියම කිරීම නිසා ඇති වන අධි ඉල්ලුම හේතුවෙන් වෙළෙඳපොළහි ඇති වන භාණ්ඩ හිඟයට පිළියම් වශයෙන් භාණ්ඩ ආනයනය කළ හැකි ය. එසේ කිරිමෙන් උපරිම මිල පැනවීමේ වාසි පාරිභෝගිකයාට ලබා දිය හැකි ය.

ClassWork.LK

එසේ ම උපරිම මිල සීමා පැනවීම නිසා අධෛර්යමත් වන නිෂ්පාදකයන් දිරිගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමෙන් ද වෙළෙඳපොළෙහි ඇති වන හානි වළක්වා ගත හැකිය.

උපරිම මිල සීමා පැනවීම නිසා වෙළෙඳපොළ මිල යන්ත්‍රණය නිෂ්ක්‍රිය වන බැවින්, හිඟ භාණ්ඩ සලාක කිරීමට සිදුවන්නේ මිල නොවන මාධ්‍යයන් භාවිත කිරිමෙන් ය.

## <u>සලාක කිරීම සඳහා යොදා ගත හැකි එවැනි මිල නොවන මාධ්‍යයන්</u>

- සලාක පත් යොදා ගැනීම
- පෝලිම් ක්‍රමය
- අල්ලස් මගින් සලාක කිරීම
- වෙනත් භාණ්ඩ සමග සම්බන්ධ කොට සලාක කිරීම.
- කළු කඩ මිල

ClassWork.LK

# අවම මිල සීමා නියම කිරීම

ඉල්ලුම් සැපයුම් බලවේග මත තීරණය වූ වෙළෙඳපොළ මිල නිෂ්පාදකයන්ට අසාධාරණ වෙතැයි යන විශ්වාසය මත නිෂ්පාදකයින්ට සාධාරණත්වයක් සැලසීම සඳහා ආණ්ඩුව විසින් සමතුලිත මිලට ඉහළින් නීත්‍යානුකූල ව නියම කරන මිල අවම මිල සීමා නියම කිරීම යන්නෙන් අදහස් වේ.


අවම මිල සීමා පැනවීමේ අරමුණ නිෂ්පාදකයන්ට සාධාරණත්වයක් සැලසීම වන බැවින් අවම මිල සමතුලිත මිලට වඩා ඉහළින් නියම කළ යුතු ය.

## සඵල අවම මිල

සමතුලිත මිලට ඉහළින් නියම කරනු ලබන අවම මිල සඵල අවම මිල නමින් හැඳින්වේ.

ClassWork.LK

# අවම මිල සීමා පැනවීම රූප සටහනින්




ඉහත රූප සටහනේ දක්වෙන පරිදි P1 අවම මිල සීමා නියම කිරීම නිසා වෙළෙඳපොළ සැපයුම් ප්‍රමාණය Q-Q2 දක්වා වැඩි වන අතර ඉල්ලුම් ප්‍රමාණය Q-Q1 දක්වා අඩු වේ.

මෙහි ප්‍රතිඵලය වන්නේ Q2-Q1 දක්වා වන අධි සැපයුමක් වෙළෙඳපොළෙහි හට ගැනීම යි.

ClassWork.LK

# අවම මිල සීමා නියම කිරිමෙහි ප්‍රතිවිපාක

- අතිරික්ත නිෂ්පාදනය වෙළෙඳපොළෙහි ගොඩ ගැසීම හෙවත් තොග සමුච්චනය වීම.

- සේවා සම්බන්ධයෙන් ගත් කල විරැකියාව වැනි ගැටලු මතු වීම.


- වෙළෙඳුන් නීතියෙන් පලා යාමට තැත් කිරීම (අවම මිල නාමික මිලක් සේ සලකා අඩු මිලට භාණ්ඩ අලෙවි කිරීම.)

- අධි ආයෝජන තත්ත්වයක් උද්ගත වීම.

- පාරිභෝගික අතිරික්තයට, නිෂ්පාදක අතිරික්තයට බලපෑම් ඇති වී සමාජ සුබ සාධනයට ද බලපෑම් ඇති වීම.

ClassWork.LK

# අවම මිලෙහි ශුභ සාධන ප්‍රතිවිපාකයන් ප්‍රස්තාර සටහනක් මගින් දැක්වීම




ClassWork.LK

## අවම මිලට පෙර,

පාරිභෝගික අතිරික්තය = A+B+C

නිෂ්පාදක අතිරික්තය = D+E

ආර්ථික අතිරික්තය = A+B+C+D+E

**<u>අවම මිලට පසු,</u>**

පාරිභෝගික අතිරික්තය = A

නිෂ්පාදක අතිරික්තය = නිෂ්පාදකයාගේ අයභාරය - නිෂ්පාදකයාගේ විචල්‍ය පිරිවැය

(නිෂ්පාදකයා Q1 සැපයීමට තීරණය කළහොත් )

$$= (B + D + F) - F$$

$$= B + D$$

$$= A + B + D$$

(නිෂ්පාදකයා Q2 සැපයීමට තීරණය කළහොත් )

= නිෂ්පාදකයාගේ අයභාරය - නිෂ්පාදකයාගේ විචල්‍ය පිරිවැය

$$B + D + F \qquad (F+G+H+I)$$

$$= B + D + F - (F + G + H + I)$$

$$= B+D-G-H-I$$

ClassWork.LK

මෙහි දී නිෂ්පාදකයා $F+G+H+I$ ලෙසින් වන විචල්‍ය පිරිවැය දරූ $Q2$ සැපයීමට තීරණය කළ ද පාරිභෝගිකයා ඉල්ලුම් කරන්නේ $Q1$ නිසා $B+D+F$ ලෙසින් වන නිෂ්පාදකයාගේ අයභාරය ඔහුගේ පිරිවැයට වඩා අඩු වේ.

මෙයින් පැහැදිලි වන්නේ නිෂ්පාදකයන්ට සාධාරණත්වය සඳහා අවම මිල සීමා පැනවීම සිදු කළත්, අපේක්ෂිත තරමේ වාසියක් නිෂ්පාදකයාට අත් නොවන බව යි.

## <u>අවම මිල අර්ථවත් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග</u>

- අතිරික්තය ගබඩා කිරීම
- අතුරු නිෂ්පාදනය
- පවත්නා ඉල්ලුම ප්‍රවර්ධනය
- අපනයනය

ClassWork.LK

# <u>මිල ආධාරක ප්‍රතිපත්ති / සහතික මිල</u>

ඉහත ක්‍රියාමාර්ගවලට අමතර ව අවම මිල අර්ථවත් කර ගැනීම සඳහා රජයක් අනුගමනය කරන සුවිශේෂ ක්‍රියාමාර්ගයක් ලෙස මිල ආධාරක ප්‍රතිපත්ති දැක්විය හැකි ය.

මිල ආධාරක ප්‍රතිපත්ති වල දී අවම මිල නිෂ්පාදකයාට ලැබෙන බව සහතික වීමක් සිදුවේ. ඒ අනුව එහි දී අවම මිල **සහතික මිලක්** සේ සැලැකේ.

## <u>මිල ආධාරක ප්‍රතිපත්තිවල ස්වරූප</u>

අවම මිල සහතික මිලක් සේ සලකමින් නිෂ්පාදකයා ආරක්ෂා කර ගනිමින් නිෂ්පාදකයන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා රජයක් අනුගමනය කරන මිල ආධාරක ප්‍රතිපත්ති ස්වරූප දෙකකි.

- රජයේ මිලදී ගැනීම් සහිත මිල ආධාරක ප්‍රතිපත්ති
- ඌන පූරණ ගෙවීම් ක්‍රමය


ClassWork.LK

# අතිරික්තය මිල දී ගැනීමේ මිල ආධාරක ප්‍රතිපත්තිය

රජයේ මිල දී ගැනීම් සහිත මිල ආධාරක ප්‍රතිපත්තිය යනු, රජය විසින් නියම කරනු ලබන අවම මිල යටතේ නිෂ්පාදකයා වෙළෙඳපොළට සැපයීමට කැමති මුළු භාණ්ඩ ප්‍රමාණයෙන් අවම මිල යටතේ පාරිභෝගිකයා මිල දී ගෙන ඉතිරි වන අතිරික්ත සැපයුම රජය මිල දී ගැනීම යි.

මෙලෙසින් වන අතිරික්ත සැපයුම රජය මිලට ගැනීම හා ඒ ආශ්‍රිත ඇති වන ප්‍රතිවිපාක පහත ලෙස රූප සටහන මඟින් දැක්විය හැකිය.

ClassWork.LK




සහතික මිලට පෙර, පාරිභෝගික අතිරික්තය = A+B+C

සහතික මිලට පසු පාරිභෝගික අතිරික්තය = A

පාරිභෝගික අතිරික්තයේ අඩු වීම = A+B+C-A

= B+C

සහතික මිලට පෙර නිෂ්පාදක අතිරික්තය = D+E

සහතික මිලට පසු නිෂ්පාදක අතිරික්තය = B+C+J+D+E

නිෂ්පාදක අතිරික්තයේ වැඩි වීම = B+C+J

සහතික මිල යටතේ අතිරික්තය මිලට ගැනීම වෙනුවෙන් රජයට දැරීමට සිදුවන පිරිවැය = C+E+G+H+K+J

පාරිභෝගිකයාගේ පැහැදම = B+D+F

නිෂ්පාදකයාගේ අයභාරය = B+C+J+D+E+F+G+H+K

(නිෂ්පාදකයාගේ අයභාරය = පාරිභෝගික පැහැදම + රජයේ පිරිවැය)

Classwork.LK

ශුභ සාධනයට වූ බලපෑම

| | | | | | |
|---|---|---|---|---|---|
| = | නිෂ්පාදන අතිරික්තයේ වැඩි වීම | - | පාරිභෝගික අතිරික්තයේ අඩුවීම | - | රජයේ පිරිවැය |

$$= B+C+J - ( B+C)- (C+E+G+H+K+J)$$
$$= - (C+E+G+H+K)$$

අතිරික්තය මිල දී ගැනීමේ මිල ආධාරක ප්‍රතිපත්තිය නිසා *(C+E+G+H+K* ප්‍රමාණයෙන් සමාජ ශුභ සාධනයේ අහිමි වීමක් සිදු ව ඇත.


ClassWork.LK

# <u>ඌන පූරණ ගෙවීම් ක්‍රමය</u>

ඌන පූරණ ගෙවීම් ක්‍රමය යනු අවම මිල සීමාව යටතේ නිෂ්පාදකයන් වෙළෙඳපොළට සැපයීමට කැමැති මුළු භාණ්ඩ ප්‍රමාණය ම පාරිභෝගිකයන් ගෙවීමට කැමති වෙළෙඳපොළ තීරණය වන මිලත් රජය විසින් පනවන ලද අවම මිලත් අතර ප්‍රමාණය රජය විසින් නිෂ්පාදකයාට ගෙවීම යි.

ClassWork.LK

# ඌන පූරණ ගෙවීම් ක්‍රමය රූප සටහනක් මගින්




| | |
|---|---|
| සහතික මිලට පෙර පාරිභෝගික අතිරික්තය | = A+B |
| සහතික මිලට පසු පාරිභෝගික අතිරික්තය | = A+B+C+F+G |
| පාරිභෝගික අතිරික්තයේ වැඩි වීම | = A+B+C+F+G - A+B |
| | = C+F+G |
| සහතික මිලට පෙර නිෂ්පාදක අතිරික්තය | = C+D |
| සහතික මිලට පසු නිෂ්පාදක අතිරික්තය | = C+D+B+J |
| නිෂ්පාදක අතිරික්තයේ වැඩි වීම | = B+J |

ClassWork.LK

$P1$ සහතික මිල යටතේ නිෂ්පාදකයා වෙළෙඳපොළට
සපයන මුළු භාණ්ඩ ප්‍රමාණය $= Q1$

$Q1$ සඳහා පාරිභෝගිකයා ගෙවීමට කැමැති මිල හෙවත්
$Q1$ සඳහා වන වෙළෙඳපොළ මිල $= P2$

ඌන පූර්ණ ගෙවීම සඳහා රජයේ පිරිවැය

$= B+J+C+F+G+K$

ශුභ සාධනයට වූ බලපෑම

= පාරිභෝගික අතිරික්තයේ වැඩිවීම + නිෂ්පාදක අතිරික්තයේ වැඩිවීම - රජයේ පිරිවැය

$= C+F+G+B+J - (B+J+C+F+G+K)$
$= -K$

-K ප්‍රමාණයෙන් සමාජ ශුභ සාධනයේ අහිමි වීමක් සිදුව ඇත.

ClassWork.LK

උඝන පූර්ණ ගෙවීම නිසා නිෂ්පාදකයාගේ අයභාරය

= B+J+K+C+F+G+D+E+H

පාරිභෝගික පැහැදම = D+E+H

(රජයේ පිරිවැය + පාරිභෝගික පැහැදම = නිෂ්පාදක අයභාරය වේ.)

ClassWork.LK

## මිල අස්ථායීතාවයන්

නිෂ්පාදිත භාණ්ඩවල මිල ගණන් නිතර නිතර උච්චාවචනය වීම මිල අස්ථායීතාවයක් ලෙස සැලකේ. මිල ගණන් අස්ථායී වන විට නිෂපාදකයින්ගේ ආදායම්හි ද අස්ථායීතාවන් ඇති වේ.

විශේෂයෙන්ම කෘෂිකාර්මික භාණ්ඩවල මිල ගණන් නිතර උච්චාවචනය වීම ප්‍රායෝගික ලෝකයේ සුලබව දැකිය හැකි කරුණකි. කෘෂි භාණ්ඩවල මිල ගණන් උච්චාවචනය නිරන්තරයෙන් සිදු වන විට ගොවීන්ගේ ආදායම් අස්ථායී වීම ප්‍රබල ගැටලුවක් වී ඇත.

## මිල ස්ථායීකරණ වැඩ පිළිවෙළවල්

මෙබඳු අවස්ථාවන්හි දී වගා කරුවන්ගේ ආදායම් ස්ථායී කිරීම සඳහා ආණ්ඩුවක් විසින් විවිධාකාර වූ මිල ස්ථායීකරණ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරනු දක්නට ලැබේ.

නිෂ්පාදකයන්මත සලාක නියම කිරීම, තොග රැස් කිරීම හා මුදා හැරීම, ඉඩම් වගා කරන ප්‍රමාණය සීමා කිරීම, ආනයන තීරු බදු පැනවීම, ආනයන සලාක කිරීම, අභිමතය පරිදි ආනයන සීමා කිරීම වැනි ක්‍රියා මාර්ග මිල ස්ථායීකරණය සඳහා යොදා ගනු ලබයි.

ClassWork.LK

# නිෂ්පාදන සලාක කිරීම

නිෂ්පාදකයන් මත සලාක නියම කිරීම ඒ අතර වැදගත් වන ස්ථායීකරණ වැඩ පිළිවෙළකි. කිසියම් නිශ්චිත කාලයක් තුළ නිපදවිය හැකි නිමැවුම් ප්‍රමාණය පිළිබඳ උපරිම සීමාවන් ආණ්ඩුව විසින් නියම කිරීම නිෂ්පාදන සලාක කිරීම යන්නෙන් අදහස් කෙරේ.

වෙළෙඳපොළට ලඟා වන සැපයුම සීමා කරමින් මිල ඉහළ මට්ටමක පවත්වා ගෙන යාමට මෙමගින් අපේක්ෂා කෙරේ.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura